# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1767/23 - 2012 ජූලි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2012.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 02/2012

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2012 ජූලි මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

ආඥාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, 2012 ජූලි මස 20 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයෙහි විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකල යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය).

2012ක් වූ ජූලි මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

1A - G 16338— 985 (2012/07)

*උපලේඛනය*

| *ශීර්ෂ අංකය* (1) | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* (2) | | *විස්තරය* (3) | *තීරුබදු ප්‍රමාණය* | | *ප්‍රමාණ ඒකකය* (6) |
|---|---|---|---|---|---|---|
| | | | | *වරණීය* (4) | *සාමාන්‍ය* (5) | |
| 22.07 | | | පරිමාව අනුව මධ්‍යසාර සැර ප්‍රමාණයෙන් 80%ක හෝ ඊටවැඩි මධ්‍යසාර ප්‍රමාණයක් ඇති ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මධ්‍යසාරය ; කවර සැර ප්‍රමාණයකින් හෝ ස්වභාවය වෙනස් කළ ඊතයිල් මධ්‍යසාරය සහ අනෙකුත් ස්ප්‍රීතු | | | |
| | 2207.10 | - | පරිමාව අනුව මධ්‍යසාර සැර ප්‍රමාණයෙන් 80%ක හෝ ඊටවැඩි මධ්‍යසාර ප්‍රමාණයකින් යුත් ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මධ්‍යසාරය | | ලීටරයට රු. 200/- | ලීටර් |

08-125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.